**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2021**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය

**------**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ (”අධිකාරිය“) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ .සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත .වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර ,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන් ,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානයවාර්තා හා වෙනත් ලියකියවිලි ,පොත්පත් ,පරිපාටි ,පද්ධති , පරිප ,මාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධතිධිමත්ව හා ප්‍රවි◌ාටි ,පොත්පත් , ;වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 - දේපල, පිරියත හා උපකරණ</u><br>(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 51 ඡේදය හා අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති අංක 4.8 අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වේ. ඒ අනුව වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමික අංක 8 ප්‍රකාරව ගිණුම්වල ගැලපිය යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය සතු රු. 2,231,885,553 ක් වූ දේපල, පිරියත හා උපකරණ සමාලෝචනයට භාජනය කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ වත්කම් නැවත තක්සේරු කිරීම සම්පූර්ණ කර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය නැවත තක්සේරු කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරිය සැලසුම් කර තිබුණි. නමුත් රටේ පැවති කොවිඩ් තත්ත්වය සමඟ ඇති වූ දුෂ්කරතා හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව ඉල්ලීමට ප්‍රතිචාර දක්වා නැත. මෙය 2022 වසර තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතු වේ. |
| (ii) අධිකාරිය විසින් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.172,661,470 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ඉහත පිළිතුරම අදාළ වේ. | වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පියවර ගතයුතු වේ. |

### 1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක: 03/2018 | 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී | චක්‍රලේඛයට අනුව නිලධාරීන්ට නව දීමනා |

| | | |
|---|---|---|
| අනුව, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව දීමනා ගෙවිය නොහැකි වුවත් අධිකාරිය කළමනාකරණ තනතුරු දරණ නිලධාරීන් 27 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2018 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි රු.50,000 ක් බැගින් කළමනාකරණ දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද රු.13,061,742 ක මුදල ඇතුළුව 2018 සිට 2021 දක්වා රු.50,128,553 ක මුළු දීමනාවක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. | පනතේ II වන කොටසේ 7(ක) වගන්තිය සහ V කොටසේ 18 වන වගන්තිය අනුව කාර්ය මණ්ඩල වැටුප් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය මගින් මෙම තීරණය ගෙන ඇත. | ලබාදීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිනට 31 දෙසැම්බර් 2021දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් මිලදී ගැනීම්වලට අදාළව ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද රු. 251,139,837ක් විය. කාල විශ්ලේෂණ වාර්තාවට අනුව දිනට වසර පහකට 31 දෙසැම්බර් 2021 වඩා වැඩි කාලයක් තිස්සේ ලැබිය යුතු මුදල රු.33,149,196ක් විය. මෙම ලැබිය යුතු බදු මුදල අඩු කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වුවද අවසන් තීරණයක් ගෙන නොතිබුණි. | සාකච්ඡා සහ පසු විපරම් ක්‍රියා සිදු කරමින් පවතින අතර, මුදල් ආපසු ලබා ගැනීම ගැන අවිනිශ්චිතතාවයක් නොමැති බැවින් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. | ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද හැකි ඉක්මනින් ලබා ගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 329,898,389 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 237,151,840 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 92,746,549 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කොවිඩ් 19 වසංගතයෙන් පසු සංචාරකයින් ආකර්ෂණය කර ගනිමින් රට තුළ ඇති වූ හිතකර තත්ත්වය හේතුවෙන් ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.803,216,822 සිට සමාලෝචිත වර්ෂයේ රු.993,344,282 දක්වා රු.190,127,460 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය**

| | 2021 (රු. මිලියන) | 2020 (රු. මිලියන) | විචලනය (රු. මිලියන) | විචලනය ප්‍රතිශතයක් ලෙස වැඩිවීම/ (අඩුවීම) % |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | **993** | **803** | **190** | **24** |
| විදේශ විකුණුම් මත වූ අධිභාර | 892 | 680 | 212 | 31 |
| අපගමන බද්ද මත සේවා ගාස්තුව | 33 | 61 | (28) | (46) |
| නියාමන සේවා වලින් ලැබෙන ආදායම | 68 | 62 | 6 | 10 |
| **මෙහෙයුම් නොවන ආදායම** | **135** | **183** | **(48)** | **(26)** |
| පොලී ආදායම | 121 | 168 | (47) | (28) |
| **කාර්ය මණ්ඩල වියදම්** | **357** | **354** | **3** | **1** |
| **පරිපාලන සහ අනෙකුත් වියදම්** | **196** | **185** | **11** | **6** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i) සමාලෝචිත වර්ෂය සඳහා මුළු ආදායම පෙර වසර හා සසඳන විට රු 040,361, 142 .කින් ,එනම් සියයට 14 කින් වැඩි වී තිබුණි.

ii) සමාලෝචිත වර්ෂය තුළ අපගමන බද්දේ සේවා ගාස්තුවෙන් ලැබෙන ආදායම අපගමන බද්ද එකතු කිරීම අඩුවීම හේතුවෙන් රු.මිලියන සිට රු 61.මිලියන කින් අඩු වී 46 දක්වා සියයට 33 තිබුණි.

iii) ප්‍රධාන වශයෙන් පොලී ආදායම රු.මිලියන කින් අඩුවීම හේතුවෙන් මෙහෙය 48ුම් නොවන ආදායම ඉකුත් වර්ෂයේ රු.මිලියන සිට සමාලෝචිත වර්ෂය තුළදී 183රු.මිලියන දක්වා 135 කින් අඩුවී 26 සියයටතිබුණි.

**2.3** **අනුපාත විශ්ලේෂණය**

| | 2021 | 2020 |
|---|---|---|
| ජංගම අනුපාතය | 2.1:1 | 1.7:1 |
| හිමිකම් අනුපාතය | 69% | 62% |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i) වර්ෂයේ 2020ජංගම අනුපාතය වූ අතර එය සමාලෝචිත වර්ෂය අවස 1.7:1න් වන විට එය දක්වා වැඩි වී 2.1:1තිබුණි ධාන වශයෙන්මෙයට ප්‍ර .වෙළඳ ගෙවිය යුතු දෑ රු.මිලියන කින් 655 අඩුවීම, භාණ්ඩාගාර බිල්පත් තැන්පතු රු.මිලියන කින් ඉහළ 172යාම සහ මුදල් හා මුදල් සමාන දෑ රු.මිලියන කින් ඉහළ යාම 90හේතු වී තිබුණි.

ii) 2020වර්ෂයට සාපේක්ෂව 2021වර්ෂයේ වත්කම් ,හිමිකම් සහ වගකීම් වල වෙනස්වීම අනුව , 5 මාණය සියයටමුළු වත්කම් ප්‍ර ට සමානව රු.මිලියන කින් 340අඩු වී , හිමිකම් සියයට 6ට සමානව රු.මිලියන කින් වැඩි වී ඇති අතර මුළු වගකීම් 262සියයට 23ට සමානව රු.මිලියන කින් අඩු වී 603 තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**3.1 කාර්ය සාධනය**

-------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------- | ------------ |
| (අ) ලංකාදරන ශ්‍රී 34 අංක 2002 සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ දක්වා ඇති පරිදි අධිකාරියේ ප්‍රධාන අරමුණු වන්නේ ශ්‍රී ලංකා භූමිය තුළ සිවිල් ගුවන් මෙහෙයුම් නියාමනය කිරීම සහ ශ්‍රී ලංකා භූමියෙන් පිටත ශ්‍රී ලංකා ලියාපදිංචි ගුවන් යානා මෙහෙයුම් නියාමනය කිරීම, ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස් කිරීමවා ලංකාව සඳහා ගුවන් සේශ්‍රී , ගුවන් ,සංවර්ධන සැලැස්මක් සකස් කිරීම මිතීන් සේවා ආරක්ෂාව පිළිබඳ උසස් ප්‍ර ගුවන් සේවා ,පවත්වා ගැනීම කර්මාන්තයට අදාළ සහතික බලපත්‍ර , සහඅවසරපත්‍ර නිකුත් කිරීමගුවන් යානා , අනතුරු පිළිබඳ විමර්ශනයන්තර ජාත්‍ය , (ICAO) සිවිල් ගුවන් සේවා සංවිධානය කිරීම යනාදිය සමඟ සම්බන්ධීකරණයයි. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අධිකාරිය විසින් අංශ ධාන කට අදාළ ප්‍ර16 ස්ථාපිත (KPIs) කාර්ය සාධන දර්ශක ,කෙසේ වෙතත් .කර තිබුණිකාර්ය සාධන දර්ශක වල ඉලක්ක ක්‍රියාකාරී සැලැස්ම සහ ආයතනික සැලැස්ම යන දෙකෙහිම සකස් කර නොතිබූ බැවින් කාර්ය සාධන දර්ශක වල ප්‍රගතිය ඉලක්ක සමඟ සැසඳිය නොහැකි විය. | කාර්ය සාධන දර්ශක වල ඉලක්ක ක්‍රියාකාරී සැලැස්ම සහ ආයතනික සැලැස්ම යන දෙකෙහිම සකස් කර ඇත. | ඉලක්ක සඳහා කාල රාමුවක් පමණක් සකස් කර තිබුණි . කාර්ය සාධන දර්ශක වල ප්‍රමාණාත්මක ඉලක්ක ක්‍රියාකාරී සැලැස්ම සහ ආයතනික සැලැස්ම යන දෙකෙහිම සකස් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකාව සඳහා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් අධිකාරිය විසින් දින දක්වා 30 සැප්තැම්බර් 2022සකස් කර නොතිබුණි. | ශ්‍රී ලංකාව සඳහා ගුවන් සේවා සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකාව සඳහා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් අධිකාරිය විසින් සකස් කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------- | ------------ |
| (අ) මානව සම්පත් තොරතුරු පද්ධතිය ය යාත්මක කිරීම බලපත්‍රකි (HRIS) ලැබී සති දෙකක් ඇතුළත සහ මූලික සේවා ගාස්තු ගෙවීමෙන් පසු ආරම්භ | ප්‍රමාදයට ප්‍රධාන හේතුව පසුගිය වසර දෙක තුළ කොවිඩ් තත්ත්වය 19 හේතුවෙන් බාහිර පුද්ගලයින් | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා අදාළ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු |

| | | |
|---|---|---|
| .කිරීමට සැලසුම් කර තිබුණි ඡේදයට 8.20 ත් ගිවිසුමේකොන්ත්‍රා අනුව මූලික නිෂ්පාදිතයේ පළමු අත්හදා බැලීම මැයි 20200වැනිදා 1 ආරම්භ කිරීමටසැලසුම් කර තිබුණි. අධිකාරිය බලපත්‍ර ගාස්තුව 2020 වන දින 11 අගෝස්තුගෙවා තිබූ අතර පද්ධතිය ට පෙර 25 අගෝස්තු 2020 ,කෙසේ වෙතත් .ආරම්භ කළ යුතුය 2022මාර්තු වන විටත් මොඩියුල 31 යපහකින් ක්‍රිාත්මක කර තිබුණේ මොඩියුල දෙකක් පමණිකෙසේ . වෙතත් ගිවිසුමේ අවසන් කරන දිනය තවද .දහන් කර නොතිබුණිස ත් කාලය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රා සම්පාදන කමිටුවේ දෙපාර්තමේන්තු ප්‍ර .අනුමැතිය ලබාගෙන නොතිබුණි | සමඟ සාමූහික කාර්යයන් ඉටු කිරීම සඳහා වැඩ කරන දින සීමා වීමයි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය දැනට සමහර යෙදුම් සඳහා HRIS .පද්ධතිය භාවිතා කරයි bot-Chatමොඩියුලය අවසන් නොවීම හේතුවෙන් අවසන් ගෙවීම සිදු කර නොමැත . AI මෙම මොඩියුලයේ ඒකාබද්ධ (කෘතිම බුද්ධිය) එය ,කිරීමේ කොටසක් ඇත සංවර්ධනය කිරීමටඅවශ්‍ය වඩාත්ම සංකීර්ණ මොඩියුලය වේ මෘදුකාංග . සමාගමට අනුව මේ වන විට ක්‍රි bot-Chatයාත්මක කිරීමේ අවසන් අදියරේ පවතී. | අතර එම පද්ධතිය කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය . |
| (ආ) වැනි දින 11 ඔක්තෝබර් 2019 ගන්නා ලද කැබිනට් තීරණයට අනුව යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය කර කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලබා දෙන අපගමන බදු ප්‍රේෂණවලින් රු.ක මුදලක් තැන්පතුවක් 1,050,000 කෙ .දවා ගෙන තිබුණිලෙස රසේ වෙතත් 2022 ,අගෝස්තු 31දින දක්වා යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය කිරීම ආරම්භ කිරීමට අධිකාරිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි . | ඵලායන්ස් එයාර් සමාගම විසින් ශීත 2022සෘතුවේදී මෙහෙයුම් ආරම්භ කිරීමේ සැලසුම් ඉදිරිපත් කර ඇත. | තැන්පතු රඳවා තබා ගැනීමේ අවශ්‍යතාවය විශ්ලේෂණය කර ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------- | ------------ |
| පලාලි ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා 31 දෙසැම්බර් 2019දින දක්වා අධිකාරිය විසින් රු. 617,131,323 ක මුළු පිරිවැයක් දරා තිබුණි. ගුවන්තොටුපළ මෙහෙයුම් කටයුතු සඳහා දී විවෘත කර 2019තිබුණි . වසංගතය 19 කොවිඩ් ,කෙසේ වෙතත් මාර්ත 2020 හේතුවෙන් මාසයේ සිට මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබුණි . . එහිදී පලාලි ගුවන් තොටුපළ සංවර්ධනයට දරන ලද වියදමපිරිවැය ඵලදායී වී නොතිබුණි. | ඵලායන්ස් එයාර් සමාගම විසින් ශීත 2022සෘතුවේදී මෙහෙයුම් ආරම්භ කිරීමේ සැලසුම් ඉදිරිපත් කර ඇත | වත්කම් ඌන උපයෝජනය වී ඇත. එබැවින් පලාලි ගුවන් තොටුපළ පිරිවැය ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | -------------------- | ------------ |
| ගුවන් යෝග්‍යතාවය (Airworthiness) පුද්ගලික බලපත්‍ර , (Personal Licensing) ,ගගන යාත්‍රාංගන (Aerodromes)ගුවන් නාවික සේවා , (Navigation Services) සහ ගුවන් සේවා ආරක්ෂාව (Aviation Security) පිළිබඳ නම් කරන ලද සිවිල් ගුවන් සේවා පරීක්ෂක සංචිතයක් බාහිර සම්පත් දායකයන් යොදා ගනිමින් සැකසීමට ජුලි 2017 දින 27අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි 2021 ,කෙසේ වෙතත් . ඔක්තෝම්බර් 2023 සිට 01 දක්වා අධි 28 පෙබරවාරිකාරියට නම් කරන ලද පරීක්ෂකවරයෙකු ලෙස අනුයුක්ත කර තිබූ නිලධාරියෙකු තාක්ෂණික නොවන රාජකාරි සිදු කරන බව නිරීක්ෂණය වූ අතර 2022 ල්අප්‍රේදක්වා රු.770,000 ක් ගෙවා තිබුණි. | දරන 34 අංක 2002ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත හරහා පැවරී ඇති බලතල සැලකිල්ලට ගනිමින් , වාහනයේප්‍ර ගුවන් විශේෂයෙන් ආදායම සම්බන්ධයෙන් තාක්ෂණික ක්ෂේත්‍රවල නිපුණ පුද්ගලයෙකු බඳවා ගැනීමට තීරණය කරන ලදී. බද්ද එකතු කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සත්‍යාපනය කළ නොහැකි ඇතැම් බදු ඇතුළත් වන බැවින් , අපගමනබද්ද හරහා ආදායම සත්‍යාපනය කිරීමට නිලධාරියෙකු අවශ්‍ය වේ මෙය . භාවිතා සඳහා වේශපත්‍රප්‍ර ත්විද්‍යු සැලැස්ම පියවීමේ බිල්පත් කරන හාශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ප්‍රේෂණය කළ හැකි යම් යම් මුදල් අහිමි වීම සම්බන්ධයෙනි පද්ධති මෙම . පිළිබඳව අපට එතරම් දැනුමක් නොමැති බැවින් වාහනප්‍ර ගුවන් , සම්බන්ධයෙන් පද්ධති සත්‍යාපනය කිරීමට සහ තවත් ආදායම් මාර්ග අධ්‍යයනය කිරීමට නිලධාරියා බඳවා ගන්නා ලදී. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ හඳුනාගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නම් කරන ලද සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරුන්ගේ සංචිතයක් නිර්මාණය කළ යුතු අතර අනවශ්‍ය බඳවා ගැනීම් සහ ගෙවීම් වළක්වා ගත යුතුය. |